පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරියේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව, වසර 05 කට වරක් සියළුම වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, 2010 වර්ෂයේ දී මෝටර් වාහන පමණක් ප්‍රත්‍යාගණනය කිරීම හැරෙන්නට සමාලෝචිත වර්ෂය තුළදී රු.30,822,356 ක් වටිනා වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබීම නිසා වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වලින් නිරූපණය වී නොතිබුණි.

(ආ) පාර්භෝගික ආරක්ෂණ අරමුදලෙහි 2012 දෙසැම්බර් 31 දිනට බැර ශේෂයක් ලෙස දැක්වෙන රු.133,374,156 ක්වූ මුදලින් රු.128,570,000 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර, ඉතිරි රු.4,804,156 ක මුදල හෙළිදරව් කර නොතිබුණි.

1.2.2 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව. | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2003 ජූන 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.5 (අ) ජේදය හා 1999 ඔක්තෝබර් 01 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව අධිකාරයේ නියෝජ්‍ය/වැඩබලන අධ්‍යක්ෂකවරුන් 05 දෙනෙකුට විධිමත් අනුමැතියකින් තොරව 2012 සැප්තැම්බර් 01 සිට රු.7,500 බැගින් වූ මාසික ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. |
| (ආ) 2010 දෙසැම්බර් 07 දිනැති අංක බීඩී/ජීපීඑස්/130/9/12 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය | කුලී පදනම මත වාහන ලබා ගැනීම අත්හිටුවා තිබුණු නමුත් 2012 වර්ෂය තුළ එකතුව රු.1,840,000 ක් වැය කර කුලී පදනම මත වාහන 04 ක් ලබාගෙන තිබුණි. 2013 මැයි වන විට අධිකාරය සතුව සංචිත වාහන 08 ක් පැවතියද, මෙම කුලී වාහන භාවිතයේ පැවතුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරයේ වැඩ කටයුතුවලින් වු මෙහෙයුම් ප්‍රතිඵලය රු.6,765,819 අතිරික්තයක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වු අතිරික්තය රු.13,821,071 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.7,055,252 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. අධිකාරයේ ඉකුත් වර්ෂයේ මෙහෙයුම් වියදම් රු.195,786,572 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී එය රු.209,636,046 ක් වූ වුයෙන් රු.13,849,474 ක එනම් 7% ක වියදම් වල වැඩිවීම ඊට ප්‍රධාන වශයෙන් හේතු වී තිබූණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී වැටලීම් හා විමර්ශනයන් 60,588 ක් සිදු කර රු.මිලියන 242.35 ක (අධිකාරියට 1/3 ක් සහ අධිකරණය මගින් රජයේ අදායමට 2/3 ක් ඇතුළුව) ආදායමක් ඉපයීමට අපේක්ෂා කර තිබුණද, වර්ෂය තුළ වැටලීම් හා විමර්ශනයන් 27,746 ක් පමණක් සිදු කර රු.මිලියන 92.09 ක ආදායමක් උපයාගෙන තිබූණි. ඒ අනුව, ඉලක්ක කළ වැටලීම් හා විමර්ශනයන් සිදු කිරීමට හෝ අපේක්ෂා කළ ආදායම ඉපයීමට අධිකාරිය අපොහොසත් වී තිබූණි.

(ආ) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 18 (1) වගන්තියට අනුව, ප්‍රජාවගේ හෝ එහි යම් කොටසකගෙ ජීවිතයට අත්‍යවශ්‍යය වන බව නියම කෙරුණු භාණ්ඩ, නිශ්චිත භාණ්ඩ ලෙස නම් කළ හැකි අතර පනතේ 18 (2) වගන්තියට අනුව, එසේ හඳුනාගත් භාණ්ඩවල සිල්ලර හෝ තොග මිල අධිකාරියේ පූර්ව අනුමැතිය ඇතිව මිස වැඩි කරනු නොලැබිය යුතු වේ. ඒ අනුව, අධිකාරිය විසින් නිශ්චිත ලෙස භාණ්ඩ 15 ක් නම් කර හඳුනාගෙන තිබුණු අතර ඉන් සිමෙන්ති,පෙට්‍රෝලියම්, කිරි ආහාර, සහල් හා කුකුල් මස් වැනි භාණ්ඩ 05 ක් සඳහා පමණක් මිල පාලනයේදී අධිකාරිය මැදිහත් වී තිබුණි. ඉතිරි භාණ්ඩ වල මිල පාලනයකට අධිකාරිය මැදිහත්වීමට කටයුතු කර නොතිබුණි. මිල පාලනය සඳහා තෝරාගත් භාණ්ඩ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කුකුල් මස්

* 2010 පෙබරවාරි 18 දිනැති අංක 1641/48 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් අධිශීතකළ සම සහිත බ්‍රොයිලර් කුකුල් මස් විකිණිය හැකි උපරිම මිලක් පනවා තිබුණද, සම ඉවත් කළ, කොටස් වශයෙන් අලෙවි කරනු ලබන අනිකුත් කුකුල් මස් සඳහා එම නියෝගය බල නොපාන හෙයින් මිල පාලනය අසාර්ථක වී තිබුණි.

* කෙසේ වුවද, 2012 ඔක්තෝබර් 18 දින වනවිට මෙම මිල පාලනය ඉවත් කර තිබුණෙන් මස්වල මිල ගණන් රු.380 සිට රු.450 දක්වා වූ පරාසයකින් මිල ඉහල ගොස් තිබූ බව අධිකාරියේ මිල කළමණාකරණ අංශය මගින් වාර්තා කර තිබුණි. පනතේ 19 (1) වගන්තිය අනුව, මෙම කරුණු විමර්ශනය කර වාර්තා කිරීම සඳහා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පාරිභෝගික සභාව වෙත වාර්තා කළ යුතු අතර, පනතේ 19 (2) වගන්තිය අනුව, එම යොමු කිරීමෙන් මාස දෙකක් ඇතුළත සභාව විසින් ස්වකීය වාර්තාව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ii) කිරිපිටි

--------

* සම්පූර්ණ යොදය සහිත කිරිපිටි.

----------------------------------

සමාගම් 04 ක් විසින් ලාභාන්තික හා බදු ඇතුළත් පිරිවැය ඇස්තමේන්තු ඉදිරිපත් කරමින් කිරිපිටි මිල වැඩි කරන ලෙස කරන ලද ඉල්ලීමට අනුව, 2012 මැයි 04 උනැති අංක 1756/32 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ග්‍රෑම් 400 කිරිපිටි පැකට්ටුවක සහ කිලෝ ග්‍රෑම් 1 ක කිරිපිටි පැකට්ටුවක මිල පිළිවෙලින් රු.61 කින් සහ රු.163 කින් වැඩි කිරීමට අධිකාරිය විසින් අවසර ලබා දී තිබුණි.

එහිදී එක් එක් සමාගම් ඉදිරිපත් කළ පිරිවැය ඇස්තමේන්තු නොසලකා පොදුවේ එකී සමාගම් මිල වැඩිකිරීමට ඉල්ලන ලද මිලට වඩා වැඩි මිලක් පාලන මිලක් ලෙස නියම කර තිබුණි. මේ නිසා නිෂ්පාදන සමාගම් ග්‍රෑම් 400 කිරිපිටි පැකට්ටුවකින් සහ කිලෝ ග්‍රෑම් 01 ක කිරිපිටි පැකට්ටුවකින් පිළිවෙලින් රු.9 සිට රු.40 සහ රු.47 සිට රු.110 දක්වා වූ ලාභ ආන්තිකයක් අතිරේක වශයෙන් උපයා ගැනීමට ඉඩ දී තිබුණි.

* යොදය රහිත කිරිපිටි.

----------------------

2003 අගෝස්තු 20 දිනැති අංක 1302/24 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් කිරි ආහාර නිශ්චිත භාණ්ඩයක් ලෙස ප්‍රකාශ කර තිබූ නමුත් යොදය රහිත කිරිපිටි සඳහා අධිකාරිය විසින් පාලන මිලක් නියම කර නොතිබුණි. මේ නිසා නිෂ්පාදකයන් හා බෙදාහරින්නන් අධිකාරියේ අවසරය නොමැතිව තමන්ට අවශ්‍ය පරිදි කිරිපිටි මිල තීරණය කර පවත්වාගෙන ගොස් තිබුණි.

(iii) ළදරු කිරි ආහාර

-------------------

* ඉහත අංක 1302/24 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් කිරි ආහාර නිශ්චිත භාණ්ඩයක් ලෙස නම් කර තිබුණද, 2012 ජුනි 18 දින වන විටත් වර්ෂ 09 කට ආසන්න කාලයක් ගතවී තිබුණද, අධිකාරිය ළදරු කිරි පිටි මිල පාලනය සඳහා මැදිහත් වී නොතිබුණි. එහෙයින් නිෂ්පාදකයන් හා විකුණුම්කරුවන් තම අභිමතය පරිදි ළදරු කිරි පිටි මිල තීරණය කර ක්‍රියාත්මක කර තිබුණි.

* කෙසේ නමුත්, පසුව අධිකාරිය 2012 ජුනි 18 දිනැති අංක 1763/4 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ළදරු කිරි ආහාර සඳහා මිල පාලනයක් සඳහා මැදිහත්වී තිබුණද, එම මිල පැනවීමද සාධාරණ නොවන බව දක්වමින් අධිකාරියට එරෙහිව එක් සමාගමක් නඩු පවරා තිබුණි.

* කෙසේ වුවද, අධිකාරිය විසින් පාලන මිල තීරණය කිරීමේ දී වෙළඳපොල මිල හා පිරිවැය ඇස්තමේන්තු විශ්ලේෂණය කර නොතිබුණු අතර, ඒ සඳහා උපකල්පන පමණක් භාවිතා කර තිබුණි. මෙම උපකල්පන, පාරිභෝගික සභාව මගින්ද අනුමත කර තිබුණි. ඒ සම්බන්ධව පවරා තිබූ නඩුව සම්බන්ධයෙන් නීතිපතිවරයා විසින් අධිකාරිය වෙත දන්වා තිබුණේ සභාව කරුණු නිසි ලෙස විමර්ෂණය කර නොමැති බැවින් ඉහත ගැසට් නිවේදනය ඉවත් කර නව ගැසට් නිවේදනයක් නිකුත් කළ යුතු බව දන්වා තිබුණත් නමුත් ඒ අනුව 2013 සැප්තැම්බර් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(iv) සිමෙන්ති මිල

--------------

2006 ඔක්තෝබර් 26 දිනැති අංක 1468/16 දරන ගැසට් පත්‍රය මගින් සියළුම වර්ගවල සිමෙන්ති නිශ්චිත භාණ්ඩයක් ලෙස නම් කර තිබුණද ඉදිකිරීම්

-----------------------------------------------------------------------------------------------------------------------------------------

සමාගම්වලට නිකුත් කරන සිමෙන්ති තොග(bulk) සඳහා එම මිල අදාල වී නොතිබුණි.

(v) තිරිඟු පිටි

-----------

2004 මැයි 23 දිනැති අංක 1342/11 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් තිරිඟු පිටි නිශ්චිත භාණ්ඩයක් ලෙස නම් කර තිබුණද, නිෂ්පාදකයින් අධිකාරයේ අවසර නොලබා මිල වැඩි කිරීමට කටයුතු කර තිබුණි. නමුත් රජයේ නීතිපතිවරයා විසින් මෙම භාණ්ඩය පාරිභෝගික අධිකාර් පනතේ 18 (2) වගන්තිය අනුව, පාලනය වන්නක් බැවින් මිල වැඩි කිරීමේ දී අධිකාරයේ පූර්ව අනුමැතිය මත සිදුකළ යුතු බව දන්වා තිබූ නමුත් තිරිඟු පිටිවල මිල පාලනය සම්බන්ධව අධිකාරයේ අධිකාර බලය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(vi) ලික්විඩයිට් පෙට්‍රෝලියම් (එල්පී) ගෑස්

---------------------------------------

* 2012 පෙබරවාරි හා මාර්තු මාසවල පිළිවෙලින් එක්සත් ජනපද ඩොලර් 1,031 හා එක්සත් ජනපද ඩොලර් 1,195 මට්ටමක පැවති ගෑස් ටොන් 1 ක මිල 2012 අප්‍රේල් සිට අගෝස්තු දක්වා එක්සත් ජනපද ඩොලර් 993 ක් හා එක්සත් ජනපද ඩොලර් 996 ක පරාසයකින් අඩුවී තිබීම පදනමක් ලෙස ගෙන භාණ්ඩාගාරය මැදිහත් වී එල්පී ගෑස් මිල රු.150 කින් අඩුකර තිබුණි. මෙවැනි මිල අඩුවෙන අවස්ථාවලදී අධිකාරය ඒ සඳහා මැදිහත් වී නොතිබුණි.

* ලිට්රෝ හා ලාෆ් යන සමාගම් 02 ක විසින් 2012 අප්‍රේල් මාසයේ කළ ඉල්ලීමකට අනුව 2012 මැයි 04 දින සිට කිලෝ ග්‍රෑම් 12.5 ක එල්පී ගෑස් සිලින්ඩරයක මිල (කොළඹ මිල) රු.350 කින් වැඩි කිරීමට ඉඩ දී තිබුණි. මිල තිරණය සඳහා ඉහත සමාගම් දෙක විසින් 2012 පෙබරවාරි හා මාර්තු මාස වල ආනයනය කළ ගෑස්වලට අදාල ඉන්වොයිස් පමණක් පදනම් කර ගෙන තිබුණි. නමුත් සමාගම් දෙකම එකම සැපයුම් කරුවෙකුගෙන් මිලදී ගෙන තිබීම, එතෙක් ඔවුන් වෙත තිබූ ඉතිරි එල්පී ගෑස් තොගය, එහි නැව තෙක් නොමිලේ (FOB) වටිනාකම්, සපුගස්කන්ද පිරිපහදුවෙන් ලබාගත් තොගවල ඉතිරි ප්‍රමාණ ආදියේ වටිනාකම් පිළිබඳව මිල වැඩි කිරීමේදී අවධානය යොමු කර නොතිබුණි.

(vii) ඖෂධ

-------

* අධිකාරිය විසින් බටහිර ඖෂධ සඳහා උපරිම සිල්ලර මිල තීරණය කිරීමේ වැඩසටහනක් සකස් කර තිබූ අතර, මෙය වෙනම ඒකකයක් ලෙස ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඒ සඳහා රු.3,616,000 ක පිරිවැය ඇස්තමේන්තුවක්ද සකස් කර තිබුණි. කෙසේ වුවද, මෙම වැඩසටහන සැලසුම් කළ පරිදි සැලකිය යුතු ප්‍රගතියක් ඇතිකර ගෙන නොතිබුණි.

* අධිකාරිය විසින් 2011 වර්ෂයේදී ඖෂධ වෙළඳාම පිළිබඳ මූලික විමර්ශනයක් සිදුකර තිබූ අතර, එම වාර්තාවට අනුව, බටහිර ඖෂධ වර්ග කිහිපයක මිල, රක්ෂණය සහ ගැල් කුලිය (CIF) අගයට වඩා සිල්ලර මිලෙහි සියයට 276 - සියයට 787 දක්වා වූ පරාසයක වැඩිවීමක් ඇති බව වාර්තා කර තිබුණි. එම විමර්ශන වාර්තාව අනුව, පාරිභෝගික කටයුතු සභාව විසින් බටහිර ඖෂධ වර්ග සම්බන්ධව ප්‍රධාන නිර්දේශ 10 ක් ඉදිරිපත් කර ඉන් 06 ක් අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ යුතු බව දක්වා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

  - පාරිභෝගික කටයුතු සභාව විසින් බටහිර ඖෂධ මිල, රක්ෂණය සහ ගැල් කුලිය (CIF) අගයෙන් සියයට 80 - සියයට 85 ත් අතර පරාසයක තැබිය යුතු බවට නිර්දේශ කර තිබුණද, ඒ පිළිබඳව ක්‍රියා කර නොතිබුණි.

  - 2002 ඔක්තෝබර් 22 දින එවකට පැවති ඖෂධ මිල පාලන ගැසට් නිවේදනය අවලංගු කිරීමටත්, 2003 පාරිභෝගික කටයුතු අධිකාරිය පිහිටුවීමෙන් පසුව නැවත, මිල පාලනය සම්බන්ධ ගැසට් නිවේදන නිකුත් කිරීමටත් කටයුතු නොකිරීම නිසා ඖෂධවල විශාල ලෙස මිල වැඩිවීමට හේතු වී තිබුණි. මින් ප්‍රයෝජන ගත් ඖෂධ ආනයනකරුවන් හා නිෂ්පාදකයන් තම අභිමතය පරිදි අධික මිල ගණන් පනවමින් පාරිභෝගිකයා සූරාකෑමට ලක්කර තිබුණද, අධිකාරිය ඒ සම්බන්ධයෙන් විධිමත් වූ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

  - පාරිභෝගික කටයුතු සභාව විසින් ඉදිරිපත් කළ නිර්දේශ 10 න් අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ යුතු බව දන්වා තිබූ නිර්දේශ 06 න් සියළුම ඖෂධවල මැකිය නොහැකි තීන්ත වර්ගයකින් ඇසුරුම් හෝ බහාලුම්වල මතුපිට හා ඇතුළත විකිණිය යුතු උපරිම මිල සලකුණු කිරීම යන නිර්දේශය පමණක් වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුණි. නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේදී සෞඛ්‍ය හා මුදල් අමාත්‍යාංශවල සහාය ලබා ගත යුතු බව සභාපතිවරයා දැනුම් දී ඇත.

(ඈ) ශ්‍රී ලංකාවේ පානීය ජල බෝතල් නිෂ්පාදනයට, නිෂ්පාදකයන් විශාල ප්‍රමාණයක් නැඹුරු වී තිබූ අතර පාරිභෝගික ජනතාවගෙන්ද ඒ සඳහා විශාල ඉල්ලුමක් වර්තමානයේදී තිබුණි. දිනකට ජල බොතල් ලක්ෂ 50 ක් පමණ වෙළඳපලේ අලෙවි වන භාණ්ඩයක ගුණත්වය සම්බන්ධයෙන් ප්‍රමිති සහතිකයන් තිබිය යුතු වුවත්, එවැන්නක් අනිවාර්ය කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම ප්‍රමිති සහතිකය අනිවාර්ය නොවීම හේතුවෙන් ඉවතලන බෝතල් පවා එකතු කර පිරිසිදු නොකරන ලද ජලය ඇසුරුම් කරන තත්ත්වයක් ඇති වී තිබුණි.

(ii) 2012 වර්ෂය තුළ අධිකාරිය විසින් සිදු කරන ලද විමර්ශනයට අනුව, ජල බෝතල් අනිවාර්ය තත්ත්ව පරීක්ෂාවකට යටත් විය යුතු බවත්, පාරිභෝගිකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කිරීම සඳහා අධිකාරියේ පාලනයට යටත් විය යුතු බවත් ප්‍රමිති කාර්යාංශයේ ප්‍රමිති සහතිකය ලබා ගැනීම අනිවාර්ය කළ යුතු බවත් නිර්දේශ කර තිබුණි.

(iii) කෙසේ වුවද, පාරිභෝගික අධිකාරිය පනතින් පැවරී ඇති බලතල අවම වශයෙන් හෝ යොදමින් ගැසට් නිවේදනයක් මගින් ප්‍රමිතියෙන් තොරව පවතින මෙම කර්මාන්තය පාලනය කිරීමට ක්‍රියාකර නොතිබුණි.

(ඇ) යහපත් හා නීත්‍යානුකූල වෙළඳ ව්‍යාපාර ඇති කිරීම මූලික අරමුණ කර ගෙන "ආදර්ශ වෙළඳසැල්" සංකල්පය හඳුන්වා දී තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේදී සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන පරිදි එවැනි වෙළඳසැල් 324 ක් හඳුනාගැනීමට ඉලක්ක කර තිබුණද, 2012 දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව අනුරාධපුර දිස්ත්‍රිකකයේ පමණක් මෙම සංකල්පය ක්‍රියාත්මක කර වෙළඳසැල් 66 ක් පමණක් හඳුනාගෙන තිබුණි.

(ඉ) වෙළඳපොල තුළ යහපත් තරඟයක් ඇතිකිරීම සඳහා දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි වැඩමුළු 280 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද, පවත්වන ලද වැඩමුළුවලින් සියයට 80 ක් කොළඹ, ත්‍රිකුණාමලය හා මාතර දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පමණක් පවත්වා තිබුණි.

(ඊ) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 39 වගන්තිය අනුව, පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවක් පිහිටුවා තිබුණද, ඒ සඳහා පනතේ 39 (2) වගන්තිය ප්‍රකාර සුදුසුකම්ලත් සාමාජිකයින් පත් කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජන වත්කම්

-------------------------------------

2012 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මගින් පාවිච්චියට ගත නොහැකි ලෙස හඳුනාගෙන තිබූ අයිතම් 82 ක් තක්සේරු කර අපහරණය කිරීමට අවශ්‍ය පියවර ගැනීමට 2013 සැප්තැම්බර් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

3.3 වෙනත් රජයේ ආයතනවලට ලබා දුන් අධිකාරියේ සම්පත්

--------------------------------------------------------

අමාත්‍යාංශයට අයත් ජීප් රථයක් 2011 වර්ෂයේදී අලුත්වැඩියා හා සේවාකිරීම් වෙනුවෙන් රු.3,361,475 ක් අධිකාරියේ අරමුදලින් වැය කර තිබූ අතර මෙම සම්පූර්ණ වියදම ප්‍රතිපූර්ණය කිරීම අමාත්‍යාංශය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි.

3.4 අධිකාර බලය නොලත් ගනුදෙනු

---------------------------------

අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව සහ සාධාරණ වෙළඳ කොමිසම ක්‍රියාත්මකව පැවති කාලයේ පිහිටුවන ලද අරමුදලක තිබූ රු.21,837,975 ක ශේෂයක් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත පැවරීම 2005 ජනවාරි 18 දින රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර තිබුණි.

මෙම මුදල් භාණ්ඩාගාරය විසින් අමාත්‍යාංශය හරහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත නිදහස් කිරීමේදී "පාරිභෝගික සේවා අරමුදල පිහිටුවීමේදී පාදක කරගන්නා ලද අරමුණු සඳහා මෙම මුදල් යොදා ගැනීම සම්බන්ධව විරුද්ධත්වයක් නොමැත" යනුවෙන් දක්වා තිබුණි. කෙසේ වුවත්, ඉන් රු.14,000,000 ක මුදලක් අරමුදල පිහිටුවීමේ අරමුණ වන පාරිභෝගික අධ්‍යාපනය හා ප්‍රවර්ධනය වෙනුවෙන් වැය නොකර වෙළඳපල විමර්ෂණ කටයුතු සඳහා යොදවාගත් පෞද්ගලික වාහන සැපයුම්කරුවන්ට කුලී ගෙවීම සඳහා භාවිතා කර තබුණි.

3.5 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

2012 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ කාර්ය මණ්ඩල තත්ත්වය පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමණාකරු | 08 | 07 | 01 |
| කළමණාකරු | 25 | 07 | 18 |
| කනිෂ්ඨ කළමණාකරු | 40 | 07 | 33 |
| විධායක නොවන | 265 | 193 | 72 |
| ප්‍රාථමික | 32 | 23 | 09 |
| | 370 | 237 | 133 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත දැක්වෙන තනතුරු 133 ක පුරප්පාඩු පිරවීමට අධිකාරිය ක්‍රියා කර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් තනතුරු 11 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවා ගෙන තිබුණු අතර ඉන් ජ්‍යෙෂ්ඨ මාධ්‍ය නිළධාරී, රියදුරු හා කාර්යාල සහායකයින් දෙදෙනෙකු රේඛීය අමාත්‍යාංශයේ රාජකාරි සඳහා මුදා හැර තිබුණි. නමුත් එම නිළධාරීන්ගේ මාසික වැටුප් ලෙස රු.684,660 ක් අධිකාරිය විසින් ගෙවා තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක නොකිරීම

2011 නොවැම්බර් 14 හා 15 දෙදින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය විධිමත් කළ යුතු බවට හා වැඩ බැලීමේ පදනම මත පත්කර තිබූ නිළධාරීන් 08 දෙනාගේ තනතුරු මාස 03 ක් ඇතුළත පිරවිය යුතු බවට නියොග කර තිබුණද, 2012 දෙසැම්බර් 31 දින වන විටත් අභ්‍යන්තර විගණන ඒකකය විධිමත්ව ස්ථාපිත කිරීමටත් වැඩබැලීමේ පුරප්පාඩු පිරවීමටත් කටයුතු කර නොතිබුණි.

### 4.2 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වා තිබූ අතර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජකයන් 03 දෙනෙකු කිසිදු රැස්වීමකට සහභාගි වී නොතිබුණි.

(ආ) අනෙකුත් සාමාජකයන්ගේ රැස්වීම් වලට සහභාගිවීමද දුර්වල මට්ටමක පැවතුණු අතර, ඉන් එක් සාමාජකයෙකු පත්වීම් දින සිට කිසිදු රැස්වීමකට සහභාගී වී නොතිබුණි. සාමාජිකයින් 04 දෙනෙකුගේ සහභාගීත්වය සියයට 04 සිට සියයට 25 දක්වා වූ පරාසයක විය.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් පාලනය

(ඇ) මානව සම්පත් කළමනාකරණය

(ඈ) නිශ්චිත භාණ්ඩ හඳුනා ගැනීම හා එහි මිල පාලන ක්‍රියාවලිය